ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2019 සැප්තැම්බර් 29 යොමු අංකය 1920-005

හිතවත් දෙමාපියන් වෙත,

**ළමා චිත්‍ර කුසලතා අගැයීම-2019-2020 - විශේෂ නිවේදනය**

ඩුබායි දහම් පාසල විසින් පවත්වන 2019-2020 අධ්‍යයන වසරේ ළමා චිත්‍ර කුසලතා ඇගයීම 2019 නොවැම්බර් මස 2 වැනිදා, සෙනසුරාදා පහත සඳහන් කාල සටහන අනුව දහම් පාසල් ශාලාවේදී පැවැත්වෙනු ඇත.

**දිනය:** 2019 නොවැම්බර් 02 සෙනසුරාදා.
**වෙලාව:**
**වයස් කණ්ඩායම් 12-14, 14-16:** පෙ ව 9.00 සිට 12.00 දක්වා (පැය 3)
**වයස් කණ්ඩායම් 10-12** : පෙ ව 9.00 සිට පෙ ව 11.30 දක්වා ( පැය 2 විනාඩි 30)

**වයස් කණ්ඩායම් 6-8 සහ 8-10** : ප ව 12.30 සිට ප ව 3.00 දක්වා ( පැය 2 විනාඩි 30)
**ස්ථානය:** දහම් පාසල් ශාලාව 02

වැදගත්;

1. වෙලාවට විනාඩි 15 ට කලින් දහම් පාසල් ශාලාව වෙත ඔබගේ දරුවා කැඳවාගෙන එන්න.
2. **හැඳුනුම් පත පැළඳීම අනිවාර්ය බව සලකන්න.**
3. **දහම් පාසල පැවැත්වෙන දිනවලදී දැනට පවතින නීති රීති අනුව වාහන නැවැත්වීම ආදිය කල යුතුය. නීතිය කඩකිරීමේදී ඔබගේ දරුවාට දහම් පාසලේ ශිෂ්‍ය භාවය අහෝසි වනු ඇත. චිත්‍ර කුසලතා අගැයීමට සහභාගී වීමට අවසර නොලැබෙනු ඇත.**
4. දෙමාපියන් නියමිත වෙලාවට පැමිණ දරුවා ශාලාවට ඇතුලත් කර දහම් පාසල් පරිශ්‍රයෙන් පිටතට යන්න. කොන්සල් ජෙනරාල් කාර්යාලය, අවට මාර්ග වල සහ පල්ලිය අසල රැඳී නොසිටින්න.
5. දරුවන් ආපසු කැඳවාගෙන යාම සඳහා: උදෑසන - පෙ ව 11.00 ට පසු සහ සවස - ප ව 2.00ට පසු පැමිණෙන්න.
6. අයදුම් පත්‍ර භාර නොදුන් දරුවන් හට ශාලාවට ඇතුලත් වීමට අවසර නොලැබෙනු ඇත.
7. කණ්ඩායම් සඳහා අදාළ චිත්‍ර මාතෘකා සඳහා දහම් පාසලේ වෙබ් අඩවියට පිවිසෙන්න. මාතෘකා වෙබ් අඩවියේ පළකරන දිනය පසුව දැනුම් දෙනු ඇත.
8. අදාළ මාතෘකාවට අනුව චිත්‍රය ඇඳීමට උපදෙස් දෙන්න. මාතෘකාවට අදාළ නොවන චිත්‍ර, තරඟයෙන් ඉවත් කිරීමට හේතුවන බව සලකන්න.
9. චිත්‍රය දහම් පාසලෙන් සපයන A3 ප්‍රමාණයේ සුදු කඩදාසියක ඇඳිය යුතු වේ. ඇඳීමට අවශ්‍ය දිය සායම්, පැස්ටල්, පාට පැන්සල් ආදිය රැගෙන එන්න. අනෙකුත් කොන්දේසි සඳහා අයදුම් පත සමග නිකුත් කල ඇමිණුම බලන්න.
10. හොඳම චිත්‍ර, සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මඟින් පත් කර ගන්නා ලද විනිශ්චය මණ්ඩලයක් විසින් තෝරාගනු ඇත. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන අතර ඒ සම්බන්ධයෙන් කිසිම සාකච්ඡාවකට සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය ඉදිරිපත් නොවනු ඇත.
11. <u>චිත්‍ර තරඟයට, ඔබගේ දරුවන් සඳහා අයදුම් පත් භාර දුන් නමුත් කිසියම් හේතුවක් නිසා අගැයීම සඳහා සහභාගී වීමට නොහැකි නම් කරුණාකර 2019 ඔක්තෝබර් 28 වැනිදා, සඳුදා දිනට පෙර</u> අප වෙත email මගින් දන්වන මෙන් ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිමු. සහභාගී වන දරුවන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා දහම් පාසලේ ගුරු මණ්ඩලය ඉතා වෙහෙස මහන්සි වී කටයුතු කිරීමට සිදුවෙන අතර, එසේ පහසුකම් සලසා, නොදන්වා සහභාගී නොවීම සියලුදෙනාගේ කාලය අපතේ යාමක් බව සළකන්න. එනිසා ඔවුනට සාධාරණයක් කිරීම සඳහා කරුණාකර මෙම දැනුම් දීම කරන ලෙස නැවතත් ඉල්ලා සිටිමු.
12. <u>තරඟයට අයදුම් පත් භාරදී, නොදන්වා තරඟයට සහභාගී නොවන දරුවන් හට ලබන වසරේ චිත්‍ර කුසලතා අගැයීමට සහභාගී වීමට අවස්ථාවක් නොලැබෙන බවද කරුණාවෙන් දැනුම් දෙමු.</u>

විස්තර සඳහා අමතන්න: මේනු : 055 3257190 චාන්දනී: 055 1177136

ස්තුතියි,

සංවිධායක කමිටුව, ඩුබායි දහම් පාසැල